**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Sabaragamuwa Provincial Department of Education**

අනාවරණ පරීක්ෂණය - 2021
Diaganostic Test

9 ශ්‍රේණිය
Grade 9

බුද්ධ ධර්මය I,II පැය දෙකයි
Buddhism I,II Two hours

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු (2) බැගින් හිමි වේ.

**1 වන කොටස**

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල වඩාත්ම නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(01) බේලුව ගමේ බුදුරජාණන් වහන්සේ වැඩ විසූ වේ,

1. පළමු වස් කාලය යි. 2. හතරවන වස් කාලය යි.
3. අන්තිම වස් කාලය යි. 3. සිව්වන වස් කාලය යි.

(02) බුදුරජානන් වහන්සේගේ ස්ථිර උපස්ථායකයා ලෙස කටයුතු කළේ,

1. ආනන්ද හිමි. 2. උපවාන හිමි. 3. මුගලන් හිමි. 3. සැරයුත් හිමි.

(03) ආනන්දයෙනි මා විසින් දේශනා කරන ලද යම් දහමක් වේද, පනවන ලද යම් විනයක් වේද, එය මාගේ ඇවෑමෙන් ඔබගේ ශාස්තෘවරයා වන්නේය,

1. මෙය දේවදත් හිමිගේ ඉල්ලීම පිට ගත් තීරණයකි.
2. අවස්ථානුකූල ගැටුමක් සංසිඳුවීමට ගත් තීරණයකි.
3. දුර දිග බලා ගත් තීරණයකි.
3. වජ්ජිපුත්තක භික්ෂූන්ගෙන් සසුන බේරා ගැනීමට ගත් තීරණයකි.

(04) මහ සඟ රුවන මනා පිළිවෙත් ඇති බැවින්,

1. සුපටිපන්න වේ. 2. උජුපටිපන්න වේ. 3. ඤායපටිපන්න වේ. 4. සාමීචි පටිපන්න වේ.

(05) සොළොස්මස්ථාන අතර ඇති ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින්නේ,

1. උතුරු පළාතේය. 2. උතුරු මැද පළාතේය. 3. වයඹ පළාතේය. 4. ඌව පළාතේය.

(06) අෂ්ඨ ගරු ධර්ම පිළිගෙන බුද්ධ කාලීනව පැවිදි වූ මුල්ම කාන්තාව වන්නේ,

1. භද්දකච්චායනා කුමරිය යි. 2. ප්‍රජාපතී ගෝතමී දේවිය යි.
3. පටාචාරාව යි. 4. කිසාගෝතමිය යි.

(07) පාසලට ගොස් එමින් සිටි රසාදරී මහ මග අයිනේ පුවක් ගස යට වැටී සීතලෙන් ගැහෙමින් සිටි ලේන් පැටවකු දුටුවාය. ඌ දෑතින් ගත් ඇය ගෙදර ගෙන ගොස් ඇති දැඩි කොට පසුව පරිසරයට මුදා හැරියා ය. මෙහිදී ඇය තුළ ඉස්මතු වූ ගුණාංගය වන්නේ,

1. මෙත්තාව යි. 2. කරුණාව යි. 3. මුදිතාව යි. 4. සමානාත්මතාවය යි.

(08) පැතුම් තම පංතියේ පළමු වැනියා වූ සුනිමල් වෙත ගොස් තම සුභ පැතුම් ඔහුට පිරිනැමුවේය. මෙයින් ඉස්මතු වන්නේ ඔහු තුළ පැවති,

1. මුදිතා ගුණය යි. 2. කරුණා ගුණය යි. 3. මෙත්තා ගුණය යි. 4. උපේක්ෂා ගුණය යි.

(09) සීලය යනු,

1. සිත , කය, වචනය, සංවර කර ගැනීම යි.
2. කය හා වචනය සංවර කර ගැනීම යි.
3. වචනය, සිත , සංවර කර ගැනීම යි.
4. කය හා සිත සංවර කර ගැනීම යි.

(10) ආමිස දානයෙන් සැලකුම් ලබන භික්ෂූන් වහන්සේ විසින් ගිහි පක්ෂයට ඉටු කල යුතු යුතුකම් ගණන,

1. තුනකි.
2. හතකි.
3. හතරකි.
4. හයකි.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(චේතනාව, සම්මා දිට්ඨි, කාමසුකල්ලිකානුයෝගය, නිරෝගී බව, සම්මා සංකප්ප, හේතුඵලවාදය)

(11) බුද්ධ කාලීනව විමුක්තිය පතා අනුගමනය කළ අන්තවාදී පිළිවෙත් දෙකක් විය. මෙයින් ශරීරයට අධික සැප දෙමින් විමුක්තිය සෙවීම ..................................................නමින් හැඳින්වේ.

(12) කෙනෙකුට ඇති උතුම්ම ලාභය ................................................... වේ.

(13) බුදුදහමට අනුව කුසල අකුසල දෙකටම මුල් වන්නේ ................................................... යි.

(14) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ යහපත් දැකීම යනු ................................................... යයි.

(15) බුදු දහමේ එන ප්‍රධාන ඉගැන්වීමක් වන පටිච්ච සමුප්පාදය ........................................... නමින් හැඳින්වේ.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශන හරි නම් (√) ද වැරදි නම් (×) ලකුණ ඉදිරියෙන් දී ඇති වරහන් තුළ ලියන්න.

(16) බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වූයේ කුසිනාරා නුවර උපවත්තන සල් උයනේදීය. ( )

(17) බුදු දහමට අනුව කියන දේ කරන යන අර්ථය යථාවාදී තථාකාරී ගුණය වේ. ( )

(18) සඟ ගුණ පාඨයේ එන සඟ ගුණ ගණන අටකි. ( )

(19) ශ්‍රී පාද පුද බිම පිහිටා ඇත්තේ සබරගමු පළාතේය. ( )

(20) සිදුහත් කුමරු වප් මගුල් උළෙලේ දී වැඩූයේ බුද්ධානුස්සති භාවනාව යි. ( )

## 11 කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(01) 1. බුදුරජාණන් වහන්සේට අවසන් කාලයේදී බලවත් වේදනාවක් සහිතව වැළඳුණු රෝගය කුමක්ද?
2. බුද්ධ චරිතය තුළින් ප්‍රකට වන නායකත්ව ලක්ෂණ 2 ක් නම් කරන්න.
3. ඥාති හිත මිත්‍රාදීන් සඳහා පිළියෙල කල සංග්‍රහය පවා පළමුව පිළිගැනීමට සුදුසු නිසා මහා සංඝරත්නය කුමන ගුණයෙන් යුක්ත වේද?
4. අටලෝ දහම නම් කරන්න.
5. ආනාපාන සති භාවනාව කෙටියෙන් හඳුන්වන්න.
6. යශෝදරා දේවිය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න.
7. පටිච්ච සමුප්පාද ධර්මයට අනුව දිළිඳුකම නිසා සමාජ ප්‍රශ්න ඇති වෙන බව පෙන්වා දෙන්නේ කුමන සූත්‍රයේද.?
8. බුදුරදුන් සුන්දරී පරිබ්‍රාජිකාවගේ අපවාදයට ලක් වූයේ ඇයි. ?
9. ලෝක පාලක ධර්ම නම් කරන්න.
10 ධම්ම පදයේ අතුළත් ගාථා ගණන හා වග්ග ගණන වෙන වෙනම දක්වන්න.

(02) 1. අවසන් බුද්ධ වචනය ලියා දක්වන්න. (ලකුණු 2)
2. සැදැහැතියන් විසින් දැක සංවේගය උපදවා ගත යුතු ස්ථාන හතරින් තුනක් නම් කරන්න (ලකුණු 3)
3. සම්බුද්ධ පරිනිර්වාන සමයේ සිදු වූ සිදුවීම් වලින් ඔබට ගත හැකි ආදර්ශ ගෙන හැර දක්වන්න (ලකුණු 5)

(03) 1. සංඝ රත්නයේ ගුණවලින් 2 ක් නම් කරන්න. (ලකුණු 2)
2. සොළොස්මස්ථානවලින් 3 ක් නම් කරන්න. (ලකුණු 3)
3. බෞද්ධ වන්දනාකරුවන් අනුගමනය කල යුතු සිරිත් විරිත් ලැයිස්තුවක් පිළියෙල කරන්න. ( අවම කරුණු 5 ක් වත් ඇතුලත් විය යුතුය) (ලකුණු 5)

(04) 1. මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ දෙමාපියන් නම් කරන්න. (ලකුණු 2)
2. යසෝදරාවගේ චරිතයෙන් කාන්තාවකට ලබාගත හැකි ආදර්ශ 3 ක් නම් කරන්න. (ලකුණු 3)
3. භික්ෂුණි ශාසනයේ ආරම්භය සිදුවූ ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 5)

(05) 1. සූකරානි අසාධුනි ………… යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)
2. ඉහත ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 3)
3. ඔබට අදාල ධම්මපද ගාථා ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 5)

(06) 1. සීලය යනු කුමක්ද? (ලකුණු 2)
2. හිරි ඔත්තප්ප දෙකෙහි අර්ථය ලියන්න. (ලකුණු 3)
3. ප්‍රාණඝාත ශික්ෂාපදය ඇසුරින් විරතිය හා සමාදානය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමි.
2. වැවයි දාගැබයි ගමයි පන්සලයි.
3. සේව්‍ය සේවක යුතුකම් ඉටුකර දියුණුව සලසා ගනිමු.
4. බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ.

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Sabaragamuwa Provincial Department of Educition

අනාවරණ පරීක්ෂණය - 2021 | 9 ශ්‍රේණිය
Diaganostic Test | Grade 9

බුද්ධ ධර්මය I,II | පිළිතුරු පත්‍රය
Buddhism I.II | Answer Sheet

1-කොටස

| | |
|---|---|
| 1. …….. (3) | 11 කාමසුකල්ලිකානුයෝගය. |
| 2. …….. (1) | 12 නිරෝගී බව. |
| 3. …….. (3) | 13 චේතනාව. |
| 4. …….. (1) | 14. සම්මා දිට්ටියයි. |
| 5. …….. (2) | 15. හේතුඵලවාදය. |
| 6. …….. (2) | 16. (√) |
| 7. …….. (2) | 17. (√) |
| 8. …….. (1) | 18. (×) |
| 9. …….. (2) | 19. (√) |
| 10.…….. (4) | 20. (×) |

ii කොටස

1. ලෝහිත පක්ඛන්දිකා රෝගය ( ලේ අතීසාරය )
2. ආදර්ශවත් බව චරිතවත් බව යථාවාදී තථාකාරී බව සමානාත්මතාවය අකම්පිත බව නම්‍යශීලී බව ආදිය. (දෙවන පාඩම බලන්න. බුදු සිරිතෙහි විශිෂ්ඨ ලක්ෂණ)
3. පාහුනෙය්‍යය
4. ලාභ - අලාභ / යස - අයස / නිනිදා - ප්‍රසන්සා/ සැප් දුක
5. හුස්ම ගැනීම හා පිටකිරීම පිළිබඳ මනා සිහිය උපදවා ගනිමින් සිදු කරන භාවනාව.
6. රාහුල මාතා / බිම්බා දේවිය /භද්දකච්චායනා
7. චක්කවත්තී සීහනාද සූත්‍රය
8. බුදු රදුන් පෙර ආත්ම භවයක මූලනී නම් ධූතයෙකුව ඉපිද සිටියදී සරභූ නම් පසේ බුදු රදුන්ට කල අපහාසය නිසා.
9. හිරි ඔත්තප්ප
10. ගාථා -423 / වග්ග 26

**දෙවන ප්‍රශ්නය**

1. හන්දදානි භික්ඛවේ ආමන්තයාමී වෝ වයදම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ.
( මහනෙනි කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්මයන් නැසෙන සුලුය. නොපමාව කුසල් දහම් වඩන්න )
2. බුදු රදුන් උපන් ස්ථානය / බුදු රදුන් පිරිනිවන් පෑ ස්ථානය / බුදු රදුන් පළමු දහම් දෙසූ ස්ථානය
3. පළමු පාඩම ඇසුරින් සලකා බලා ලනුණු දෙන්න.

**තෙවන ප්‍රශ්නය**

1. සුපටිපන්න/ උජුපටිපන්න /ඤායපටිපන්න/සාමීචිපටිපන්න/ආහුනෙය්‍යය/පාහුනෙය්‍යය/ දක්ඛිණෙය්‍ය/ අඤ්ජලිකරණීය/

අනුත්තරං/ පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස

2. මහියංගනය නාගදීපය කැළණිය ශ්‍රී පාදය දිවාගුහාව..... (4 පාඩම 23 පිටුව)

3. සිරිත් විරිත් පහක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

**හතරවන ප්‍රශ්නය**

1. අංජන රජු ( පියා) මශෝදරා දේවිය (මව)
2. පති භක්තියෙන් කටයුතු කල බව

නැදි මයිලනුවන්ට යටහත්ව කීකරුව විසිය යුතු බව

ගුණ ගරුක මැණි කෙනෙකු විය යුතු බව

නිරහංකාර බව

චාම් සරල ජීවන රටාවක් පවත්වාගෙන යා යුතු බව

නිකැලැල් චරිතයකින් යුක්ත වි යුතු බව

විශ්ෂ්ඨ ඥානයකින් යුක්ත වි යුතු බව

ඕනෑම ගැටළුවකදී ඉවසීමෙන් කටයුතු කල යුතු බව

6 පාඩම 34 35 36 37 38 පිටු කියවා ලකුණු ලබා දෙන්න.

**පස්වන ප්‍රශ්නය**

1. සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච

යං වේ හිතංච සාධුංච - තං වේ පරම දුක්කරං

2. අයහපත් දෙ මෙන්ම තමාට අහිත පිණිස හේතුවන හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකිය.

යහපත් දෑ මෙන්ම තමාට හිකර වූ දේ කිරීමඉතා අපහසුය.

3. යහපත අයහපත නිවරදිව හඳුනා ගැනීම.

යහපත් දේ තම ජීවිතයට ලගා කර ගැනීම.

පස් පවින් වැලකීම.

අයහපත් ගති ඇති මිතුරන්ගෙන් ඈත් වීම.

දස අකුසලයෙන් වෙන්වීම.

වැරදි කරන්නන් ඉන් මුදවා ගැනීමට උත්සාහ කිරීම.

මෙම පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

**හයවන ප්‍රශ්නය**

1. කය වචන සංවර කර ගැනීම.

2. එවි කිරීමට ඇති ලිප්ජාව හා භය

3. ප්‍රානඝාතය පිළිබඳ හඳුන්වා විරතිය හා සමාදානය පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලතුණු ලබාදෙන්න.

**හයවන ප්‍රශ්නය**

අදාළ පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.